**<u>බස්නාහිර පළාතේ පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1 (අ) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2023 (අදියර II)</u>**

බස්නාහිර පළාතේ පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1 (අ) ශ්‍රේණියට බඳවා ගැනිම සඳහා වන විවෘත තරඟ විභාගය - 2023 (අදියර II) සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. 2023.09.22 දිනැති පළාත් සභා ගැසට් පත්‍රයේ පළ කර ඇති අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරුණු මනාව අවබෝධ කර ගැනීමෙන් අනතුරුව www.psc.wp.gov.lk යන අපගේ නිල වෙබ් අඩවියට පිවිස, මාර්ගගත ක්‍රමය මඟින් අයදුම්පත් 2023.10.09 දිනට ප්‍රථම යොමු කිරීම සිදු කල යුතුය.

03. නිවැරදිව සම්පූර්ණ කර බාගත කර ගන්නා ලද අයදුම්පත් අයදුම්කරුගේ අත්සන සහිතව හා අත්සන සහතික කර ගැනීමෙන් අනතුරුව 2023.10.16 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ " ලේකම්, බඳවාගැනීම් ශාඛාව, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නො 628, 10 වන මහල, ජනජයසිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

- මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් බාරගනු නොලැබේ.
- මාර්ග ගත ක්‍රමය ඔස්සේ අයදුම්කර (Online) බාගත කර (Download) නොගන්නා ලද අයදුම්පත් හා පරිගණකය මඟින් සකස් කර මුද්‍රණය කර ගන්නා ලද අයදුම්පත් සියල්ල දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ.
- අසම්පූර්ණ ලෙස තොරතුරු යොමු කර ඇති අයදුම්පත්, මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ.
- සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි ඡායාපිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනිම ප්‍රයෝජනවත් වනු ඇත.
- අයදුම් කරනු ලබන විෂයයන් කිසිසේත් වෙනස් කරනු නොලබන අතර එක් අයදුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.
- අයදුම්පත සමඟ කිසිදු සහතිකයක් අමුණා නොඑවිය යුතුය. මුදල් ගෙවීම කළ බවට කුවිතාන්සියේ මුල් පිටපත පමණක් <u>අලවා එවිය යුතුය</u>. (<u>අමුණා එවීම නොකළ යුතුය</u>.)

04. අයදුම්පතෙහි අයදුම්කරනු ලබන විෂයයන් සඳහන් කිරීමේදී, රජයේ ගැසට් පත්‍රයේ උපලේඛණ 01 යටතේ සඳහන් කර ඇති දැනට පවතින පුරප්පාඩු හා මාධ්‍ය පිළිබඳ විස්තර අනුව අදාළ විෂයය තෝරා ගැනීම සිදු කළ යුතුවේ.

**<u>05. දමිළ මාධ්‍ය අයදුම්කරුවන් සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් මාර්ගගතව අයදුම්පත සම්පූර්ණ කිරීමේ පහසුකම සළසා ඇත.</u>**

06. දැනට රාජ්‍ය සේවයේ තනතුරක සේවය කරන අයදුම්කරුවෙකු නම් අයදුම්කරු විසින් අයදුම්පතේ අංක 16 යටතේ සඳහන් තොරතුරු අනිවාර්යයෙන් සම්පූර්ණ කලයුතු අතර, දැනට රාජ්‍ය සේවයේ තනතුරක සේවය නොකරන අයදුම්කරුවන් අයදුම්පතේ අංක 17 යටතේ සඳහන් තොරතුරු <u>**පමණක්**</u> සම්පූර්ණ කිරීම ප්‍රමාණවත් වේ.

**තිලක් සෙනරත්**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත